# විජාතික බලවේගවල හිස එසවීම

පසුගිය සති කිහිපයෙහිම අප විසින් ලියන ලද ලිපි නැවතත් මතක් කළ යුතු යැයි සිතෙයි. සති දෙකකට පෙර ඔස්ලෝ යමුද යන මැයෙන් ලියන ලද ලිපියෙහි අවසන් ඡේදය පහත දැක්වෙයි. "කොටි ඔස්ලෝ නුවර ඊනියා සාම සාකච්ඡා ආරම්භ කරන ලෙස ඉල්ලන අතර හමුදාවට පහරදෙන බව මෙහිදී අපේ අවධානයට යොමු විය යුතු ප්‍රධාන කරුණය. ඒ ඉල්ලීම හා පහරදීම පිටුපස බටහිර ක්‍රිස්තියානි රටවල්වෙයි. අද බටහිරයන් කරන්නේ කොටි පහරදීම් නැවැත්වීමට නම් ඊනියා සාම සාකච්ඡා ඔස්ලෝහිදී පැවැත්විය යුතු බවට ආණ්ඩුවට බලකිරීමය. මේ බලපෑම් ගැන ආණ්ඩුව කතා නොකරයි. අපේ රටේ ස්වෛරීභාවය යන්න ගණිකාවකගේ (තම නැති බැරිකමට ස්වාමියා රැකීම සඳහා ගණිකා වෘත්තියේ යෙදෙන අසරණයින් නොව) පතිවත වැනිය. අප රට අද පෙරදිග මුතු ඇටය නොව බටහිර ක්‍රිස්තියානි නූතනත්වය නමැති ගිරයට හසු වූ පුවක් ගෙඩියකි. ආණ්ඩුව මේ බලපෑම්වලට යටත් වුවහොත් ඊනියා සාම සාකච්ඡා ඔස්ලෝහිදී ඇරඹෙනු ඇත්තේ කොටි සාම සාකච්ඡාවට කැඳවීමට හැකිවීම මහින්ද රාජපක්ෂ මහතා ලත් ජයග්‍රහණයක් බවට බටහිරයන්ගෙන් හා මෙරට සාම කාක්කන්ගෙන්ද සහතික ලබමින්ය. මහින්ද රාජපක්ෂ මහතාගේ රාජ්‍ය තාන්ත්‍රික උපායඥානය පිළිබඳව ශ්තෝත්‍ර ගැයීමට ආණ්ඩුවේ ජනමාධ්‍ය එකිනෙකා අභිබවමින් පෙරට එනු ඇත. ආණ්ඩුව යම් අයුරකින් බටහිර බලපෑමට යටත් නොවන්නේ නම් මෙරටට එක්සත් ජාතීන්ගේ හමුදා එවීමට බටහිරයන් කටයුතු කරනු ඇත. ඒ ක්‍රියාමාර්ග දෙකම පරාජය කිරීමට ආණ්ඩුවට හැකිය. එහෙත් එහිදී ජනතාවට සියල්ල හෙළිකර ජනතා සහාය ලබාගත යුතුය. ඉන් පසු සතියෙහි අප කියා සිටියේ ඔස්ලෝ යැමට විරුද්ධව ආණ්ඩුව තදින් සිටියහොත් බටහිරයන් ප්‍රභාකරන් ඉවත් කිරීම ගැන සලකා බලනු ඇති බවත්, එහෙත් ඔවුන් කොටි සංවිධානය දිගටම පවත්වාගෙන යනු ඇති බවත්, එක්සත් ජාතීන්ගේ හමුදා කැඳවීමට ඉඩ ඇති බවත්ය.

ඒ සියල්ල ඒ අයුරින්ම සිදු නොවන්නට ඇත. එහෙත් සමස්තයක් ලෙස ගත්කල සිදු වී ඇත්තේ කුමක්ද? ඊනියා සාම සාකච්ඡා ඔසලෝහිදී නොසිදුවනු ඇත. එහෙත් ඒ ආණ්ඩුවට ජයග්‍රහණයක්ද? ජිනීවා නුවර යැමට ලැබීම ගැන කොටි අසතුටු නොවනු ඇත. ඔවුන්ට අවශ්‍ය වූයේ නිල වශයෙන් යුරෝපයට යැමටය. අද ආණ්ඩුව බටහිර බලපෑම් හමුවෙහි ජිනීවා යැමට කැමති වී ඇත. දැන් බටහිරයන්ට අවශ්‍ය දෙය කෙරී ඇත. ඇමරිකන් තානාපතිගේ බොරු ගර්ජන ගැන අපි තැකීමක් නොකෙළෙමු. ඔවුන් කොටින්ට තර්ජන කරන බව අපට පෙන්නුම් කෙරිණි. ඔවුන්ට අවශ්‍ය වූයේ ප්‍රභාකරන් යම් පමණකට මෙල්ල කිරීම මිස වෙනත් දෙයක් නොවෙයි. පසුගියදා වන්නියේදී සිදු වූ බෝම්බ ප්‍රහාරය කාගේ වුවමනාවකට කෙරිණිද ඉන් මියගියේ කවුරුන්ද යන කරුණු අපි නිශ්චිතව නොදන්නෙමු. එහෙත් බටහිරයන්ගේ අනුදැනුමෙන් කෙරිණි නම් අප පුදුමවිය යුතු නොවෙයි. කොටි ඔස්ලෝ නොගොස් ජිනීවා යැමට කැමතිවීම බටහිරයන්ට අවශ්‍ය දේ ඉටුවීමකි. ඔස්ලෝ නොයැම ගැන සාමාන්‍ය ජනයා සතුටු වනු ඇත. එහෙත් ජිනීවා යැම ගැන ඔවුන්ට සතුටු නොවිය හැකිය. කොටි ජිනීවා යැම සමඟ යුරෝපා සංගමය කොටින්ට පැන වූ බොරු ගමන් තහංචිය බොරුවක්ම බව තහවුරු වෙයි. එහෙත් ආණ්ඩුවේ හොරණෑ පත්තර කියනු ඇත්තේ ඔස්ලෝ නොයැම ලංකාණ්ඩුවේ ජයග්‍රහණයක් බවය.

සියල්ල සිදුවන්නේ බටහිරයන්ට අවශ්‍ය අන්දමට මිස අපට අවශ්‍ය අන්දමට නොවෙයි. ජාතික බලවේග නැවතත් යට යමින් පවතියි. පසුගිය නොවැම්බරයේදී මහින්ද රාජපක්ෂ මහතාට ඡන්දය දුන් බොහෝ දෙනා 1956 දී මෙන්ම අනාථ කරනු ලැබී ඇත. මහින්ද රාජපක්ෂ මහතා ජයග්‍රහණය කිරීමෙන් පසුව විජාතික බලවේගවලින් ඒ ජයග්‍රහණය ආරක්ෂා කරගන්නේ කෙසේද යන ප්‍රශ්නය අපි ජනාධිපතිවරණ වේදිකාවෙන් නිරතුරුවම ඇසීමු. එහෙත් එයට ලැබුණු යහපත් ප්‍රතිචාරයක් නොවීය. අද රාජපක්ෂ මහතා ආරක්ෂා කර ගන්නේ කාගෙන් දැයි ඇතමකු ප්‍රශ්න කරනු ඇත. ඒ මහතා ආරක්ෂා කිරීමට සිදු වී ඇත්තේ විජාතික බලවේගයන්ගෙනි. කෙහෙළිය රඹුක්වැල්ල හා මහින්ද සමරසිංහ යන මහත්වරු දැනටමත් ඇමැතිවරු වී සිටිති. මේ ලිපිය ලියන මොහොත වනතුරු ජී. එල්. පීරිස් මහතා ඇමැතිවරයෙක් නොවෙයි. එහෙත් ඒ මහතා ඇමැතිවරයකු වීම කාලය පිළිබඳ ප්‍රශ්නයක් පමණකි. ඒ මහතා ව්‍යවස්ථාදායක කටයුතු පිළිබඳ ඇමැති වුවහොත් ඒ පුදුමයක් නොවිය යුතුය. ඔවුන් ආණ්ඩුවට එකතු වන්නේ බටහිරයන්ගේ වුවමනාවටය.

තව සතියකින් පමණ අපි ඊනියා නිදහස සමරමු. අපට සැමරීමට නිදහසක් තිබේද? සොල්හයිම්ට ඇති බලය මෙරට කිසිවකුට හෝ තිබේද? ඇමරිකන් රාජ්‍ය දෙපාර්තමේන්තුවට මෙරට ධවල මන්දිරයේ අගුවක් වැනිය. එහි නිලධාරීහු

© Prof. Nalin De Silva

මෙරටට එති යති. බටහිරයන්ට, ඔවුන් වැනිම වූ ජපානයට හා අසල්වැසි ඉන්දියාවට අපරට කෙළිබිමකි. අපට කළ හැක්කේ ඔවුන් කියන දේ කිරීම පමණකි. මෙරට මහජනයාට අවුරුදු පහකට හයකට වරක් ඡන්ද බලය ලැබෙයි. මහජනයාට ඊනියා පරමාධිපත්‍ය ඇත්තේ නාම යෝජනා දිනයේ සිට මැතිවරණ දිනය දක්වා පමණකි. ඉන්පසු නැවතත් නාම යෝජනා දිනයක් වනතුරු ඔවුන්ට ඇති පරාමාධිපත්‍යයක් තබා සුළුඳිය පහකිරීම හැරෙන්නට සුළු ආධිපත්‍යයක්වත් නැත. බටහිර කසිකබල් පංඩිතයන්ට අනුව මහජනයා තමන් වෙනුවෙන් පරමාධිපත්‍යය දැරීමට පාර්ලිමේන්තුවක් පත් කර ගනිති. මේ බයිලා පමණකි. මහජනයා මැතිවරණයේදී කරන්නේ ඊනියා පරමාධිපත්‍යය උගස්තැබීමකි. උගස හිමිවන්නේ වැඩිම වුවහොත් කැබිනට් මණ්ඩලයට හා ජනාධිපතිවරයාට සමීප විය හැකි කිහිපදෙනෙකුටය. එහෙත් එයද නියම පරමාධිපත්‍යයක් නොවෙයි. රන් ආලේප කළ භාණ්ඩවලට රත්තරන් බඩු යැයි කීමට පුරුදු වී ඇති ජනතාවකට පුහු පරමාධිපත්‍යයක් නියම පරමාධිපත්‍යයක් යැයි සිතීමට පාසල්, විශ්වවිද්‍යාල හා ජනමාධ්‍ය ඔස්සේ පුරුදු කෙරෙයි. මහජනයා මැතිවරණයේදී කරන්නේ පුහු පරමාධිපත්‍යයක් උගස් තැබීමකි. එය රත්තරන් බඩු යැයි සිතමින් රන් ආලේපිත භාණ්ඩ උගස්බඩු කඩයේ සේවකයකුට උගස් තැබීමට සමානය. අපට නිදහස දිනාගැනීමට තව බොහෝ කල් ගතවනු ඇත. කොස් මාමා යන නමින් ප්‍රසිද්ධ වී සිටි ආතර් වී දියෙස් මහතා 1948 පෙබරවාරි හතරවැනිදා තම නිවසෙහි කළු කොඩියක් ඔසවා තැබූ බව මම කුඩාකල පියාගෙන් අසා ඇත්තෙමි. කොස් මාමා එසේ කළේ ඇයි දැයි නොදනිමි. ඔහු කිනම් අර්ථයකින් එසේ කළද එහි වැදගත්කමක් ඇති බව සෝල්හයිම්ගේ කෙසෙඟ සිරුර රූපවාහිනියේ දකින දකින වාරයක් පාසා වැටහෙයි.

මහින්ද චින්තනය මෙරට මහජනයාගෙන්, විශේෂයෙන්ම සිංහලයන්ගෙන් බහුතරයේ චින්තනය බව පැහැදිළිය. එහෙත් මහින්ද චින්තනය ක්‍රියාත්මක කිරීමට බටහිරයන් ඉඩ නොදෙනු ඇත. මහින්ද චින්තනය ක්‍රියාත්මක කිරීමට නම් ප්‍රථමයෙන්ම බටහිරයන් කරන සියළු බලපෑම් ජනතාව හමුවේ තබා රටවෙනුවෙන් අනාගත පරම්පරාව වෙනුවෙන් කරන විශාල කැප කිරීමකට ජනතාව මෙහෙය විය යුතුය. එසේ නැතිව බටහිරයන්ගේ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන ජී. එල්. පීරිස් මහතා වැන්නවුන් ඇමැති මණ්ඩලයට පත්කර රට වෙනුවෙන් කළ හැක්කේ කුමක්ද? ආණ්ඩුව වෙනුවෙන් ජී. එල්. පීරිස් මහතා ජිනීවාහි පැවැත්වෙන ඊනියා සාම සාකච්ඡා සඳහා සහභාගිවීමට ඇති ඉඩකඩ ඉතා අඩිකය. එවැනි තීරණයක් මතුපිටින් නම් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ තීරණයක් වෙනු ඇත. එහෙත් මෙරට ජනාධිපතිවරුන්ට තමන්ට අවශ්‍ය දෙයක් කිරීමේ නිදහස නැත. අවුරුදු පන්සියයක් තිස්සේ රටේ විශේෂයෙන්ම බටහිර වෙරළබඩ තීරුවේ නිදහස තිබී ඇත්තේ බටහිර ආණ්ඩුකාරයන්ට අග්‍රා

ණ්ඩුකාරයන්ට තානාපතියන්ට මහකොමසාරිස්වරුන්ට හා විශේෂ නියෝජිතයන්ට පමණකි. අපේ නිදහස් සටන තවම නියමාකාරයෙන් දෙපාරුවාගැනීමටවත් සමත් වී නැත. බටහිර මතවාද, ප්‍රවාද හා සංකල්පවලින් අපේ හිස් පිරී තිබෙනතාක් කල් ඒ හිස් සැබෑ අරුතකින් නම් හිස් මිස පිරී නැති බටහිර දැනුම් ආධිපත්‍යයෙන් මිදීමේ අවශ්‍යතාව පිළිබඳ හිස් හිස් ඇති උගතුනට වැටහීමක් නැත. සාමාන්‍ය ජනතාවට දී ඇති හැඟීම නම් මොවුන් මහ බුද්ධිමතුන් බවය.

බටහිරයන්ට එක්සත් ජාතීන්ගේ හමුදා ගෙන්වීමේ අවශ්‍යතාවක් අද නැත. ජිනීවා නගරයෙහි ඇත්තේ දර්ශනීය විල් පමණක් නොවෙයි. එහි ස්විස් බැංකුද වෙයි. මේ බැංකුවල මෙරට ඇතැමුන්ගේ රහස් ගිණුම් ඇති බව නම් රහසක් නොවෙයි. රනිල් ප්‍රභාකරන් ගිවිසුම හෙවත් ඊනියා සටන් විරාම ගිවිසුම රනිල් වික්‍රමසිංහ මහතාගේ කෙටුම්පතක් නොවෙයි. ඔහු එයට අත්සන් කළා පමණකි. ජිනීවා නගරයෙහි දී තව තවත් ගිවිසුම් ඇතිවීම වැළැක්විය හැකි නොවෙයි. ඒ ගිවිසුම්වලට ජී. එල්. පීරිස් මහතා වැන්නවුන් කරනු ඇත්තේ අත්සන් කිරීම පමණකි. ගිවිසුම් කෙටුම්පත් කෙරෙනු ඇත්තේ ඇමරිකන් එක්සත් ජනපදවල අනුදැනුමද ඇතිව යුරෝපයෙහිය. එක් අතකින් බලන කල යුරෝපයෙහි කෙටුම්පත් කෙරෙන ගිවිසුම් අත්සන් කිරීමට යුරෝපයට මිස වෙනත් තැනකට යෑමේ අවශ්‍යතාවක්ද නැත. මහින්ද රාජපක්ෂ මහතා ඊනියා යථාර්ථය අවබෝධ කරගෙන ඇතැයි අර හිස් හිස් පඬුවන් (මේ කුමාරතුංග මුනිදාස මහතා වෙනත් සන්දර්භයකදී නිර්මාණය කළ ප්‍රකාශයක කොටසක් වෙයි) කියනු ඇත. මේ ඊනියා යථාර්ථයද මිනිසුන්ගේ නිර්මාණයක් පමණකි. මිනිසුන්ගේ මනසින් තොරව ඊනියා යථාර්ථයක් හෝ කසිකබල් යථයක් හෝ ඇති බව මනසින් තොරව පෙන්වාදිය හැකි අයකු වේ නම් මම ඒ අයගේ ශිෂ්‍යයකු වීමට සූදානම්ව සිටිමි. මහින්ද රාජපක්ෂ මහතා අවබෝධ කරගෙන ඇතැයි මේ හිස් හිස් පඬුවන් බටහිරයන්ගේ රොබෝවරුන් මෙන් කියන ඊනියා යථාර්ථය

© Prof. Nalin De Silva

යනු අන්කිසිවක් නොව විජාතික බලවේග සරණගොස් ඇති බටහිර යටත්විජිතවාදය පරාජය නොකළ හැකිය යන මතයය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva